# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1827/5 - 2013 සැප්තැම්බර් මස 09 වැනි සඳුදා - 2013.09.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

මහින්ද රාජපක්ෂ

**ජනාධිපති විධානය**

1. මහාචාර්ය හිතනාදුර ජානක ද සිල්වා මැතිතුමා
2. මහාචාර්ය කාමිනි නිර්මලා මෙන්ඩිස් මැතිතුමිය
3. මහාචාර්ය ආනන්ද රාජිත වික්‍රමසිංහ මැතිතුමා
4. මහාචාර්ය හේමා මාලිනි කුඹල්ගොඩ කංකානම් පතිරණ මැතිතුමිය
5. මහාචාර්ය හේමන්ති රණසිංහ මැතිතුමිය
6. මහාචාර්ය විජේරූපගේ සන්ධ්‍යා සුලෝචනා විජේසුන්දර මැතිතුමිය
7. මහාචාර්ය ලක්ෂ්මන් ලොයිඩ් රත්නායක මැතිතුමා
8. මහාචාර්ය අවුරෙලියා ජෙනිෆර් පෙරේරා මැතිතුමිය
9. මහාචාර්ය දෙල්ගහවත්තගේ රාජ් කුමාර් සෝමදේව දෙල්ගහවත්ත මැතිතුමා

10 මහාචාර්ය විරංජිත් ප්‍රියාන් සොලමන් ඩයස් මැතිතුමා

11. මහාචාර්ය කදිරගමනාදන් කන්දසාමි මැතිතුමා

12 මහාචාර්ය අරුණි තිලකරත්න මැතිතුමිය

13. ආචාර්ය නන්ද අමරසේකර මැතිතුමා
14. ආචාර්ය රොහාන් ප්‍රසන්ත පෙරේරා මැතිතුමා
15. ආචාර්ය ගල්බඩ ආරච්චිගේ සිරිමල් ප්‍රේමකුමාර මැතිතුමා
16. ආචාර්ය නිහාල් ජිනසේන මැතිතුමා
17. මොක්සෙවි ප්‍රේලිස් මැතිතුමා

වෙත,

1A - G 18236 — 180 (2013/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සුභාශිංසන පෙරටුවයි !

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, 2007 ජූලි මස 24 වැනි දින දරන ජනාධිපති විධානය මගින් ජාතික පර්යේෂණ සභාව පිහිටුවනු ලැබූ හෙයින් ද,

තවද, එකී සභාව වඩාත් පුළුල් නියෝජනයකින් යුක්තවීමේ අවශ්‍යතාවය හඳුනාගනු ලැබ ඇති හෙයින් ද, දැනට ක්‍රියාත්මකව පවතින සභාවේ සාමාජික මණ්ඩලයේ ධූර දැරීම අවසන්කර, ඒ වෙනුවට නව සංයුතියකින් යුත් සාමාජික මණ්ඩලයක් පත්කිරීමට අදහස් කරමි.

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍යය හා විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, මෙමගින් පෙර කී,

1. මහාචාර්ය හිතනාදූර ජානක ද සිල්වා මැතිතුමා
2. මහාචාර්ය කාමිනි නිර්මලා මෙන්ඩිස් මැතිතුමිය
3. මහාචාර්ය ආනන්ද රාජිත වික්‍රමසිංහ මැතිතුමා
4. මහාචාර්ය හේමා මාලිනි කුඹල්ගොඩ කංකානම් පතිරණ මැතිතුමිය
5. මහාචාර්ය හේමන්ති රණසිංහ මැතිතුමිය
6. මහාචාර්ය විජේරූපගේ සන්ධ්‍යා සුලෝචනා විජේසුන්දර මැතිතුමිය
7. මහාචාර්ය ලක්ෂ්මන් ලොයිඩ් රත්නායක මැතිතුමා
8. මහාචාර්ය අවුරෙලියා ජෙනිෆර් පෙරේරා මැතිතුමිය
9. මහාචාර්ය දෙල්ගහවත්තගේ රාජ් කුමාර් සෝමදේව දෙල්ගහවත්ත මැතිතුමා
10 මහාචාර්ය විරංජිත් ප්‍රියාන් සොලමන් ඩයස් මැතිතුමා
11. මහාචාර්ය කදිරගමනාදන් කන්දසාමි මැතිතුමා
12 මහාචාර්ය අරුණි තිලකරත්න මැතිතුමිය
13. ආචාර්ය නන්ද අමරසේකර මැතිතුමා
14. ආචාර්ය රොහාන් ප්‍රසන්ත පෙරේරා මැතිතුමා
15. ආචාර්ය ගල්බඩ ආරච්චිගේ සිරිමල් ප්‍රේමකුමාර මැතිතුමා
16. ආචාර්ය නිහාල් ජිනසේන මැතිතුමා
17. මොක්සෙවි ප්‍රේලිස් මැතිතුමා

වන ඔබ පූර්වෝක්ත ජනාධිපති විධානය ප්‍රකාරව පිහිටුවනු ලැබූ ජාතික පර්යේෂණ සභාවේ සාමාජිකයන් ලෙස, මවිසින් මෙයින් පත් කරනු ලබන අතර, පූර්වෝක්ත මුල් විධානයේ (i) සිට (viii) දක්වා වන කර්තව්‍යයන් ක්‍රියාවට නංවාලනු පිණිස අවශ්‍ය විය හැකි සියලුම පියවර ගන්නා මෙන් ඔබට මම මෙයින් විධාන කරමි.

තවද, පෙරකී මහාචාර්ය හිතනාදූර ජානක ද සිල්වා මැතිතුමා ජාතික පර්යේෂණ සභාවේ සභාපතිවරයා වශයෙන් මම තවදුරටත් මෙයින් පත්කරමි.

තවද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටුකරලීමට අදාළව අවශ්‍ය විය හැකි පරිදි පරීක්ෂණ කිරීම සහ කරුණු විමර්ශනය කිරීම පිණිස උපදෙස් නිකුත් කිරීමට ජාතික පර්යේෂණ සභාව වෙත මම මෙයින් බලය පවරමි.

තවද, ජාතික පර්යේෂණ සභාව විසින් උපදෙස් නිකුත් කරන්නා වූ, හෝ ආධාර හෝ තොරතුරු ඉල්ලා සිටිනු ලබන්නා වූ හෝ රාජ්‍ය නිලධාරීන් හෝ වෙනත් තැනැත්තන්ට එසේ වූ සියලු උපදෙස් පිළිපදින ලෙසටත්, යථා පරිදි සැපයිය හැකි ආධාර හා තොරතුරු සපයන ලෙසටත් මෙයින් නියම කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් දහතුනක් වූ සැප්තැම්බර් මස 09 දින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

19 - 1013

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.